# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1857/13 - 2014 අප්‍රේල් මස 09 වැනි බදාදා - 2014.04.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත**

මධ්‍යම පළාතේ පළාත් සභාවේ මන්ත්‍රී ධුරයක පුරප්පාඩු පිරවීම

මධ්‍යම පළාතේ පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු මිය යාම හේතු කොටගෙන එම පළාත් සභාවේ මන්ත්‍රී ධුරයක පුරප්පාඩුවක් ඇති වී තිබෙන බව 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 65(1) වැනි වගන්තිය යටතේ මධ්‍යම පළාතේ පළාත් සභාවේ ලේකම්වරයා විසින් මා වෙත දන්වා තිබෙන හෙයින් ද ;

එකී පුරප්පාඩුව පුරවනු පිණිස තෝරා පත්කර ගත් මන්ත්‍රීවරයා අයත්ව සිටි පිළිගත් දේශපාලන පක්ෂය වන එක්සත් ජාතික පක්ෂයේ ලේකම්වරයාට ඉහත කී පනතේ 65(2) වැනි වගන්තිය යටතේ සුදුසුකම් ඇති තැනැත්තෙකු නාමයෝජනා කරන ලෙස මවිසින් නියම කර ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයා විසින් එකී පුරප්පාඩුව පුරවනු පිණිස අබුබක්කර් හාෂීම් මොහොමඩ් ඉබ්‍රාහීම් මහතා නාමයෝජනා කර ඇති හෙයින් ද ;

මැතිවරණ කොමසාරිස් වඩුගේ වරුණසිරි මහින්ද දේශප්‍රිය වන මම, 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 65(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, අබුබක්කර් හාෂීම් මොහොමඩ් ඉබ්‍රාහීම් මහතා එම පුරප්පාඩුව සිදු වූ මාතලේ පරිපාලන දිස්ත්‍රික්කයේ ඉහත සඳහන් පළාත් සභාවේ මන්ත්‍රීවරයා ලෙස තේරී පත්වී ඇති බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

මහින්ද දේශප්‍රිය,
මැතිවරණ කොමසාරිස්.

2014 අප්‍රේල් මස 08 වන දින,
මැතිවරණ මහලේකම් කාර්යාලය,
රාජගිරිය.

04 - 671

1A - G 19383— 100 (2014/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත

### උතුරු පළාතේ පළාත් සභාවේ මන්ත්‍රී ධුරයක පුරප්පාඩු පිරවීම

උතුරු පළාතේ පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු පක්ෂ සාමාජිකත්වයෙන් නෙරපා හැරීම හේතු කොටගෙන එම පළාත් සභාවේ මන්ත්‍රී ධුරයක පුරප්පාඩුවක් ඇති වී තිබෙන බව 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 65(1) වැනි වගන්තිය යටතේ උතුරු පළාතේ පළාත් සභාවේ ලේකම්වරයා විසින් මා වෙත දන්වා තිබෙන හෙයින් ද ;

එකී පුරප්පාඩුව පුරවනු පිණිස තෝරා පත්කර ගත් මන්ත්‍රීවරයා අයත්ව සිටි පිළිගත් දේශපාලන පක්ෂය වන එක්සත් ජනතා නිදහස් සන්ධානය පක්ෂයේ ලේකම්වරයාට ඉහත කී පනතේ 65(2) වැනි වගන්තිය යටතේ සුදුසුකම් ඇති තැනැත්තෙකු නාමයෝජනා කරන ලෙස මවිසින් නියම කර ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපලන පක්ෂයේ ලේකම්වරයා විසින් එකී පුරප්පාඩුව පුරවනු පිණිස ආරුප්පිල්ලෙ සින්නදුරෙ තවරාජා මහතා නාමයෝජනා කර ඇති හෙයින් ද ;

මැතිවරණ කොමසාරිස් වඩුගේ වරුණසිරි මහින්ද දේශප්‍රිය වන මම, 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 65(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, ආරුප්පිල්ලෙ සින්නදුරෙ තවරාජා මහතා එම පුරප්පාඩුව සිදු වූ යාපනය පරිපාලන දිස්ත්‍රික්කයේ ඉහත සඳහන් පළාත් සභාවේ මන්ත්‍රීවරයා ලෙස තේරී පත්වී ඇති බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

මහින්ද දේශප්‍රිය,
මැතිවරණ කොමසාරිස්.

2014 අප්‍රේල් මස 09 වන දින,
මැතිවරණ මහලේකම් කාර්යාලය,
රාජගිරිය.

04 - 706

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.